උ.ප.රා.සේ.කො.චක්‍ර ලේඛ අංක 11/2016

මගේ අංකය NP/07/10/01/82

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

උතුරු පළාත,

යාපනය.

2016.09.01

අමාත්‍යාංශ ලේකම්වරුන් ,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**උතුරු පළාත.**

**ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil) III වැනි ශ්‍රේණියේ තනතුරු හා පුහුණු ශ්‍රේණිය තනතුරු වලට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2016**

උතුරු පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී (සිවිල් - Civil) III වැනි ශ්‍රේණියේ තනතුරු හා පුහුණු ශ්‍රේණිය පුරප්පාඩු වලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් 2016 ඔක්තෝබර් මස යාපනයේ දි පැවැත්වෙන බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **28.09.2016**වේ.

**02 බඳවා ගැනීමේ සේවා කොන්දේසි**

02.1 2013.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ අනුමත කරන ලද කොන්දේසි සහ බඳවා ගැනීමේ ව්‍යවස්ථාවේ විධිවිධාන යනාදිය හා ඒවායෙහි කලින් කලට සිදු කරනු ලබන වෙනස් කිරීම් වලටත්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා සමාජවාදි ජන රජයේ අංක 1817/30 සහ 2013.07.03 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගන්නා ලද අයදුම් කරුවන් එම තනතුරේ 111 වැනි ශ්‍රේණියට හෝ පුහුණු ශ්‍රේණියට පත්කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට එක් වසරක් පරිවාස කාලයකට යටතේ III වැනි ශ්‍රේණියේ පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගන්නා ලද දිනයේ සිට වසර 03 ක කාලයක් ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩයිම් විභාගයෙන් සමත්විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරු සහිත සේවයකි. එබැවින් මෙම පත්වීම් ලබන අය උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළයුතු බවට වූ කොන්දේසියට යටත්විය යුතුය.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන්නෙකු එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළයුතු බවට අනිවාර්ය වූ කොන්දේසියකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දි නිකුත් කරනු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 05 ක් අවසන්වීමට පෙර එහි සඳහන් දෙවැනි රාජ්‍ය භාෂාවකින් සමත්විය යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක කරනු ලබන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. ඇතැම් පුරප්පාඩු හෝ සම්පූර්ණ පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත .

**03 සුදුසුකම්:-**

**03.1 තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil) පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය)**

**(අ) අධ්‍යාපන සුදුසුකම්:-**

භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), විද්‍යාව, ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) වාර දෙකකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**(ආ) වෘත්තීය සුදුසුකම්:-**

**පහත දක්වන වෘත්තීය සුදුසුකම් වලින් එකකින් හා අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු පහකට නොඅඩු පලපුරුද්දක් ලබා තිබිය යුතුය.**

(1) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ(සිවිල් - Civil) ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය(NCT) ලබා තිබීම.

**හෝ**

(2) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ(සිවිල් - Civil) ක්ෂේත්‍රයක ජාතික සහතික පත්‍ර පාඨමාලාවක් (NCC) සාර්ථකව හදාරා සහතිකය ලබා තිබීම.

**හෝ**

(3) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඊහත සඳහන් තාක්ෂණික සහතිකයේ නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලුම අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**සමග**

**(ඉ) සේවා පලපුරුදු:-**

අදාළ ක්ෂේත්‍රයේ ප්‍රාථමික මට්ටම හෝ රට උසස් සේවකින් ස්ථිර දෙපාර්තමේන්තුව තනතුරේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය ලෙෂ අවුරුදු 10 සේවා පලපුරුදු ලබා තිබිය යුතුය.

**03.2 තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil) - III වැනි ශ්‍රේණිය (කෙලින්ම බඳවා ගැනීම)**

**(අ) අධ්‍යාපන සුදුසුකම්:-**

භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), විද්‍යාව, ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) වාර දෙකකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**(ආ) වෘත්තීය සුදුසුකම්:-**

**පහත දක්වන ආයතනයකින් තනතුරට අදාළ, එක් වෘත්තීය සුදුසුකම් හෝ ලබා තිබිය යුතුය.**

(1) මොරටුව විශ්වවිද්‍යාලය හා අම්පර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව(සිවිල් - Civil)සහතිකය,

**හෝ**

(2) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ඉංජිනේරු විද්‍යා (සිවිල් - Civil)ජාතික ඩිප්ලෝමා සහතිකය,

**හෝ**

(3) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු(සිවිල් - Civil) ඩිප්ලෝමා සහතිකය,

**හෝ**

(4) ශ්‍රී ලංකාවේ පිළිගත් විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික (සිවිල් - Civil) ඩිප්ලෝමා සහතිකය,

**හෝ**

(5) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය(IESL) විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

(6) තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil) අංශයට අදාළජාතික වෘත්තීය කුසලතාවේ (NVQ) 06 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම.

**හෝ**

(7) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඉහත සඳහන් තාක්ෂණික සහතිකයේ නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලුම අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**සමග**

**(ඉ) සේවා පළපුරුද්ද:-**

අදාළ ක්ෂේත්‍රයේ ප්‍රාථමික මට්ටම හෝ රට උසස් සේවයකින් ස්ථිර දෙපාර්තමෙන්තුව තනතුරේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය ලෙස අවුරුදු පහට සේවා පලපුරුදු ලබා තිබිය යුතුය.

සටහන

කුමන හෝ තනතුරක ස්ථිර පත්වීමට පෙර සේවය කරන ලද හෝ කුමණ හෝ තනතුරක ස්ථිර පත්වීමක් ලැබීමේ කොන්දේසි සහිතව සේවය කර ඇති හෝ පුහුණුව ලැබීමේ කාලසීමාවක් වශයෙන් ඉහත 03.1(ඉ) හා 03.2(ඉ) වගන්තියේ සඳහන් කරන ලද සුදුසුකම් ලබාගැනීම සඳහා වසර පහක කාලසීමාව ලෙෂ ගණන් ගණු නොලැබේ. කුමණ හෝ තනතුරක ස්ථිර පත්වීමක් ලැබීමට පෙර තාවකාලික, අනියම් පදනමෙන් සේවය කරන ලද කාලසීමාවන් ඉහත 03.1(ඉ) හා 03.2(ඉ) වගන්තියෙහි සඳහන් සුදුසුකම් ලබාගැනීම සඳහා වසර පහක කාලසීමාව ලෙෂ ගණන්ගණු නොලැබේ. ඒ සඳහා අතිරේඛ ලකුණු ලබාදෙනු නොලැබේ.

## 04. බඳවාගැනීමේ ක්‍රමය:-

04.1 ලිඛිත පරීක්ෂණයක් පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දි බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව බඳවා ගනුලැබේ.මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දි පරීක්ෂා කරණු ලැබේ.අවශ්‍යවන සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරණු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දි සියලු සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා අමතර ලකුණු කිසිවක් ලබාදෙණු නොලැබේ.

04.2 ඉහත සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් ඔවුන් ලැබූ මුලු ලකුණුවල අනුපිලවෙල අනුව පත්වීම් ලබාදීම සඳහා තෝරාගනු ලැබේ.

04.3 2016.01.28 දින දක්වාවූ පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට 30 කට නොවැඩි ගණනක් මෙම විභාලය මගින් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

## 05. විභාග ගාස්තු:-

උතුරු පළාතේ පිහිටි තැපැල් කාර්යාලයකින් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ නමට හා යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයේදී මාරු කර ගත හැකි වන පරිදි ලබාගත් රු.500/= වටිනා මුදල් අණවුමක් අයදුම්පතෙහි අදාළ කොටුවෙහි නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කරනු නොලැබේ.

**06. ඉල්ලුම් කරන ක්‍රමය:-**

06.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ ( සෙමී 21 X සෙමී 29) ප්‍රමාණයේ කොළයක 01 සිට 4.5 දක්වා වූ කොටස් පළමුවැනි පිටුවේත්ද 4.6 සිට 7 දක්වාවූ කොටස් දෙවැනි පිටුවෙන්ද ඉතිරි ඒවා අනෙක් පිටුවේත් ඇතුලත්වන පරිදි අයදුම් පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2016.09.28** වැනි දිනට හෝ ඊට පෙර ලැබිමට හැකිවන පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාව, උතුරු පළාත අංක 393/48, කොවිල් පාර, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

06.2 අයදුම්පත්‍රයේ 1.1යටතේ අයදුම්කරුගේ නම සදහන් කිරීමේ දි සම්පූර්ණ නමේ අවසානයට ඇති නම මුලින් සඳහන් කර අනතුත් මුල් අකුරු නමෙහි අගට සඳහන් කළ යුතුය.

**උදාහරණ:-**අයදුම් පත්‍රයේ 1හි SISIRA KUMARA . H.M. යනුවෙන් සඳහන් කළ යුතුය.

06.3 එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil) III වන ශ්‍රේණියේ තනතුරු හා පුහුණු ශ්‍රේණිය තනතුරු වලට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය 2016"** යනුවෙන් සදහන් කළ යුතුය.

06.4 අයදුම් පත්‍රයේ ජායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ජායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගණු නොලැබේ. විභාගය සදහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ.විභාගය සදහා ප්‍රවේශ පත්‍රය එවනු ලැබීම අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බව අදහස් නොකෙරේ.

06.5 අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට වත් කලින් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් ඒ බව පහත සදහන් විස්තර සහිතව **ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කොවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය 021- 221 9939, පැක්ස්අංකය 021- 221 9940)

**සටහන:**

ඉල්ලීමේ ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැදුණුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල්ලිපිනය, අයදුම් පත්‍රයේ පිටපතක්, අයදුම් පත්‍රය ලියාපදිංචි තැපැලෙන් යවන ලද තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, විභාග ගාස්තු ගෙවූ සහතික කරන ලද ජායා පිටපත , ප්‍රවේශ පත්‍රය යැවිය යුතු පැක්ස් අංකය.

**07. පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම**

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිට සෑහීමකට පත්විය හැකි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරනමෙන් ඉල්ලා සිටිනු ලැබේ.පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමණ හෝ එකක් පිළිගණු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමෙන්තුව විසින් නිකුත් කරන ලද හැඳුණුම් පත .
(11) වළංගු විදේශ ගමන් බලපත්‍රයක්. (Passport)

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම් කරුවෙකුගේ හිමිකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අභිමතය පරිදි අවලංගුකළ හැකිය. විභාගය පැවැත්වීම පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නිති රීතිවලට අයදුම්කරුවන් අවනතවිය යුතුය. එකී නිති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත්විය යුතුය.

**08. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්**

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුයි. අයදුම්කරු සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, කුමන අවස්ථාවක හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කල හැක.

**09. වැටුප් පරිමාණය**

- ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ (සිවිල්) III වන ශ්‍රේණිය සඳහා:
  රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 **හි වැටුප් කේත අංක MN3-2016 අනුව** බඳවා ගනු ලබන ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට, අදාල වන මාසික වැටුප් පරිමාණයරු: 31,040/= - 10x445 - 11x 660 - 10x730 - 10x750 - 57,550/=වේ.(රු. 32,375/= **වැටුප් පියවරට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකින් සමත් විය යුතුය.) එහෙත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.**

- තාක්ෂණික නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණියට
  රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **03/2006 වගුව v**ට අනුව (මාසික දීමනාව)
  - **පළමු වර්ෂය - රු 15,924.00/=**
  - **දෙවන වර්ෂය – රු 16,100.00/=**

**10. විභාග පරිපාටිය**

මෙම විභාගය පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා දෙකින් පවත්වනු ලැබේ. අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| **අංක** | **ප්‍රශ්න පත්‍රය** | **විෂය නිර්දේශය** | **කාලය** | **ලකුණු** |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය මගින් අපේක්ෂකයාගේ තර්කාණුකූලව සිතීමේ හැකියාව, තීරණ ගැනීමේ හැකියාව, හා විශ්ලේෂණය කිරීමේ හැකියාව යනාදිය පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න වලින් සමන්විත වේ. | පැය01යි | 100 යි |
| 02 | තාක්ෂණික දැනුම සම්බන්ධ පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය මගින් අපේක්ෂකයාගේ ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් මූලික දැනුම , ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි වලට අදාළ සැලසුම් (Plan) ඇඳීම හා සැලසුම් (Plan)අවබෝධ කර ගැනීමේ හැකියාව, මැනීම, අත්තිවාරම් දැමීම, පස් වර්ගය , මාර්ග නිර්මාණය කිරීම හා නඩත්තු කිරීම, ඇස්තමේන්තු සෑදීම, ජල සම්පාදනය, කාණු සෑදීම හා අපද්‍රව්‍ය ඉවත් කිරීම යනාදිය සම්බන්ධයෙන් ඇති දැනීම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න වලින් සමන්විත වේ. | පැය03යි | 100 යි |

**සටහන**

(i) අයදුම්කරු විසින් කාර්යක්ෂමතා රාජකාරිය ඉටුකිරීම ගෙන මහුට ඇති සුදුසුකම් හා හැකියාව යනාදිය පරීක්ෂා කිරීම සම්බඳව ප්‍රශ්න පත්‍ර සක්ස් කරනු ලැබේ.

(ii) මෙම විභාගය තරග විභාගයක් වුවත් එයින් පත්වීමට සුදුසුකම් ලැවීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයන් සඳහා වෙන් කර ඇති ලකුනු වලින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය.ලබා ගත් මුලු ලකුණු පදනම් කරගෙන ලකුණු අනු පිලිවෙළට (Rank Order) පත්වීම් ලබාදෙනු ලැබේ.

**11.** අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.np.gov.lk වෙබ් අඩවියෙහි පළ කරන අතර පසුවඋතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**12.** මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමේ බලය ***"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්"*** සතු වේ.

**13.** මේ චක්‍ර ලෙඛයේ දෙමළ හෝ සිංහල භාෂාවේ යම් කිසි වෙනසක් ඇතොත්, දෙමළ භාෂාවෙක් සඳහන් නිවේදනය නිවැරදි බව සළකිය යුතුවේ.

**14.** මේ දැන්වීම උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.np.gov.lk වෙබ් අඩවිය මහින් ලබා ගත හැක.

***රූ.වරදලිංගම්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
2016.09.01

පිටපත්:

1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම කාර්යාලය, උතුරු පළාත. - **විස්තර සඳහා**
2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන, උතුරු පළාත. - **විස්තර සඳහා**
3. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - **ඉංජිනේරු**, උතුරු පළාත. - **විස්තර සඳහා**